**සිංහල පරිවර්තනය**

# උතුරු පළාත් සභාවේ ජලජ ජීවීන් සංවර්ධන නිලධාරී සේවයේ III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ තරඟ විභාගය – 2021

උතුරු පළාත් සභාවේ ජලජ ජීවීන් සංවර්ධන නිලධාරී සේවයේ III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පැවැත්වීමට නියමිත බව මෙයින් දන්වා සිටිනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසානය දිනය **17.02.2021 වේ**.

## 02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි :-

02.1 උතුරු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද ජලජ ජීවීන් සංවර්ධන නිලධාරී සේවයේ බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් කොන්දේසීන් හා, ආයතන සංග්‍රහයේ විධිවිධානයන් ද, මුදල් රෙගුලාසීන් හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක 1817/30 හා 2013.07.03වන දින දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා වූ ආයතන කාර්ය සංග්‍රහය යනාදීන් ට යටත්ව තෝරා පත්කර ගන්නාවූ විභාග අපේක්ෂකයන් **ජලජ ජීවීන් සංවර්ධන නිලධාරී සේවයේ ෂෂ වන ශ්‍රේණියේ** තනතුරට පත් කරනු ලැබේ.

02.2 තරඟ විභාගය මඟින් පත්වීමට තෝරාපත් කර ගන්නා විභාග අපේක්ෂකයන් පත්වීම් ලබන දින සිට වසර තුනක් (03) පරිවාස කාලයට යටත් කර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර තනතුරක් වන අතර විශ්‍රාම වැටුප් හිමි තනතුරකි. බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි බඳවා ගන්නා ලද දින සිට වසර තුනක (03) කාලය තුළ පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුයි.

02.3 මෙම සේවය ස්ථාන මාරුවලට යටත් වූ සේවයක් වන අතර පත්වීම් ලබන්නන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුයි යන කොන්දේසියට යටත්විය යුතුයි.

02.4 පත්වීම් සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධාරියා විසින් නිර්වචනය කරනු ලබන අතර පත් කිරීමට නියමිත සංඛ්‍යාව **04**. එසේ වුවද නිවේදනයේ සඳහන් පුරප්පාඩු සම්බන්ධයෙන් වූ පුරප්පාඩුන් හෝ සියළුම පුරප්පාඩු පූර්ණය නොකර සිටීමේ බලතල පත්වීම් බලධාරියා සතුය.

## 03 වැටුප් පරිමාණය :-

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 පරිදි, වැටුප් පියවර **MN 1 – 2016**ට අනුව **ජලජ ජීවීන් සංවර්ධන නිලධාරී III වන ශ්‍රේණියට** එක්බද්ධ වැටුප් ප්‍රතිශතය වනුයේ රුපියල් **27,140 – 10 x 300 - 11 x 350 - 10 x 495 – 10 x 660 – 45,540/-කි**. (රුපියල් 28,040.00 යන වැටුප් තලයට ප්‍රථම පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්විය යුතුයි)

## 04 සාමාන්‍ය සුදුසුකම් :-

04.1 අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුයි.

04.2 අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකිවන පරිදි කායික නිරෝගිභාවයකින් යුත් අයෙකු විය යුතුයි එමෙන්ම මනා චරිතවත් පුද්ගයකුද විය යුතුයි.

04.3 අ) අයදුම්කරු උතුරු පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි අයදුම්පත් කැඳවන අවසන් දිනට ප්‍රථම වසර හයක (06) කාලපරිච්ඡේදය තුළ අවම වශයෙන් වසර තුනක් (03) උතුරු පළාතේ අඛණ්ඩව පදිංචිවී සිටි අය විය යුතුයි.

**හෝ**

ආ) උතුරු පළාත අයදුම්කරු හෝ අයදුම්කරුගේ දෙමාපියන්ගේ උපන් ස්ථානය විය යුතු අතර අවම වශයෙන් වසර පහක් (05) උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතුයි **(සම්මුඛ පරීක්ෂණයේ දී ඡන්ද නාම ලේඛනයෙන් උපුටා ගන්නා ලද සහතික කළ උපුටනයක් ඉදිරිපත් කළ යුතුයි)**

04.4 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට ප්‍රථම මෙම තනතුර සඳහා කැඳවන ලද **සියලුම සුදුසුකම්** අයදුම්කරු විසින් සපුරා තිබිය යුතුයි.

## 05. අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් :-

**අ) අධ්‍යාපන සුදුසුකම් :-**

අ.පො.ස (සා/පෙ) විභාගයෙන් **එකවර** පළමු බස (දෙමළ / සිංහල / ඉංග්‍රීසි), ගණිතය යන විෂයන් ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හයක්(06) සමත්වී තිබිය යුතුයි.

**ඒ සමගම**

අ.පො.ස (උ/පෙ) විභාගයෙන් අවම වශයෙන් එක් විෂයයක් සමත්වී තිබිය යුතුයි. (පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර)

**ඒ සමගම**

**ආ) වෘත්තීය සුදුසුකම් :-**

රජය විසින් අනුමත කරන ලද ආයතනයකින් ධීවර/ජලජීවී ක්ෂේත්‍රයේ අවම වසර දෙකක් (02) ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථකව හදාරා අවසන් කර තිබිය යුතුයි.

**ඇ) වයස් සීමාව :-**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරුගේ **වයස අවුරුදු 18 නොඅඩු**, **වයස අවුරුදු 35 ට නොවැඩි** විය යුතුයි.

## 06 බඳවා ගැනීමේ ක්‍රමය :-

06.1 ලිඛිත විභාගයෙන් සමත්වීමට අවම වශයෙන් ලකුණු 40% ක් එක් එක් විෂයයන් සඳහා ලබාගත යුතුයි. ලිඛිත විභාගයෙන් හා කුසලතා පදනම මත්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවා ගැනීමේ පරිපාටින්, ජාතික හා පළාත් ප්‍රතිපත්තීන් යනාදිය පරිදි **ජලජ ජීවීන් සංවර්ධන නිලධාරී සේවයේ ෂෂෂ වන ශ්‍රේණියේ** තනතුරට බඳවා ගනු ලැබේ. මෙම දැන්වීම මගින් කැඳවා ඇති සුදුසුකම් සියල්ල සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් නැති බව අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා හිමි අයිතිවාසිකම් අහෝසි කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී සුදුසුකම් සමඟ අවශ්‍ය ලියකියවිලි ද පරීක්ෂා කරනු ලබන අතර ඒ සඳහා ලකුණු ප්‍රදානය කරනු නොලැබේ.

06.2 ලිඛිත පරීක්ෂණයෙන් ලබාගත් සම්පූර්ණ ලකුණු ප්‍රමාණයේ ඉහල ලකුණු අනුපිළිවෙළ අනුව පවතින පුරප්පාඩු සඳහා සම්මුඛ පරීක්ෂණයට තෝරාගනු ලැබේ.

## 07. විභාග ගාස්තු :-

අපේක්ෂකයන් පදිංචි වී සිටින උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක රුපියල් **500.00** ක් ගෙවා **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** ගේ **"3401"** යන ගිණුමට මුදල් බැර කළ කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුව තුළ නොගැළවෙන සේ අලවා එවිය යුතුයි. මොනම හේතුවක් නිසා හෝ මෙම ගාස්තු නැවත ගෙවනු නොලබන අතර මෙම ගාස්තුව වෙනත් කිසියම විභාගයක් සඳහා මාරු කිරීමට අවසර දෙනු නොලැබේ.

## 08. අයදුම් කිරීමේ ක්‍රමය :-

08.1 මෙම දැනවීම අවසානයේ ඇති ආදර්ශ අයදුම්පතට අනුකූලව A4 ප්‍රමාණයේ (21 සෙ.මී x 29 සෙ.මී) කඩදාසියක 1 සිට 10 දක්වා තිබෙන ඡේද පළමු පිටුවේ ද, 11 සිට 14 දක්වා තිබෙන ඡේද දෙවන පිටුවේ ද, ඉතිර කොටස් අනෙක් පිටුවේ ද ආවරණය වන පරිදි අයදුම්පත සකස් කර ගත යුතුයි. සම්පූර්ණ කරන ලද අයදුම්පත **17.02.2021** වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි, **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක: 393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් යොමු කළ යුතුයි.

08.2 අයදුම්පත් යොමු කරන ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ **"ජලජ ජීවීන් සංවර්ධන නිලධාරී සේවයේ සස වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2021"** යනුවෙන් සඳහන් කළ

යුතුයි. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා, අවශ්‍ය තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08.3 අයදුම්පතේ ඡායා පිටපත ඔබ බාරයේ තබා ගැනීම ප්‍රයෝජනවත් වන අතර අයදුම්පතේ ඡායා පිටපත් හෝ පූර්ව නිශ්චිත පිටපත් යනාදීන් භාරගනු නොලැබේ. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් නිකුත් කරනු ලැබේ. **විභාගය සඳහා ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම යනු අයදුම්කරු විසින් සියළුම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් සේ නොසැළකිය යුතුයි.**

08.4 අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන්ට ප්‍රවේශපත් නිකුත් කළ පසු ඒ පිළිබඳව පුවත්පත් මගින් දැන්වීමක් නිකුත් කරනු ලැබේ. දැන්වීම පළවූ පසු යම්කිසි අපේක්ෂකයකුට අවම වශයෙන් විභාගය පැවැත්වීමට නියමිත දින තුනකට (03) ප්‍රථම හෝ ප්‍රවේශ පත්‍ර ලැබුණේ නැතිනම්, ඒ පිළිබඳ පහත සඳහන් තොරතුරු සමග, **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක: 393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්වීමට කටයුතු කළ යුතුයි. (දුරකථන අංකය - 021 221 9939, ෆැක්ස් අංක - 021 221 9940)

**ඇමතීමේදී ඉදිරිපත් කළ යුතු තොරතුරු :-**
**ආවරණය ලිපියක්, අයදුම්පත්‍රයේ ජායාපිටපතක් හා විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ සහතික කරන ලද පිටපත, ප්‍රවේශපත්‍ර යොමු කිරීම සඳහා ෆැක්ස් අංකයක්.**

08.5 විභාගයට අයදුම් කරන අපේක්ෂකයන්ගේ අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැන්වීමක් නිකුත් කරනු නොලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සුදුසුකම් සම්පූර්ණ කර නැති අපේක්ෂකයන්ගේ අයදුම්පත් පෙර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර ඒ හා සම්බන්ධ දැන්වීම් කිසිවක් නිකුත් කරනු නොලැබේ..

## 09. අනන්‍යතාවය තහවුරු කිරීම :-

විභාග අපේක්ෂකයන් තමන් පෙනී සිටින සෑම විෂයන්ටම විභාග ශාලාධිපති තෘප්තිමත් වන පරිදි තම අනන්‍යතාවය තහවුරු කළ යුතු බව දන්වා සිටින අතර අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් කුමක් හෝ එක් ලියවිල්ලක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම් පත

(ii) වලංගු ශ්‍රී ලංකා ගමන් බලපත්‍රය.

(iii) රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් කරන ලද ලියවිල්ලක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන විභාග අපේක්ෂකයෙකුට විභාගය සඳහා පෙනී සිටීමේ හිමිකම ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, ගේ අභිමතය පරිදි ප්‍රතික්ෂේක කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් නැඹුරු විය යුතුයි. එම නීතිරීති උල්ලංඝනය කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් තුමා විසින් පනවනු ලබන දඬුවමට යටත් වීමට සිදුවේ.

## 10. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම :-

අයදුම්පත් සම්පූර්ණ කරන විට ඉතා අවධානයෙන් යුතුව සත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතුයි. මෙම විභාග නීතිරීති ප්‍රකාර කිසියම් අපේක්ෂකයෙකු විභාගයට ප්‍රථම හෝ විභාගය පැවැත්වෙන විට හෝ විභාගයෙන් පසුව කුමණ අවස්ථාවකදී හෝ වුව ද සුදුසුකම් සම්පූර්ණ කර නැති බවට අනාවරණය වන්නේ නම්, එම අපේක්ෂකයාගේ විභාගයට පෙනී සිටීමේ හිමිකම වහාම ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති යම්කිසි තොරතුරක් අසත්‍ය බවට ඔප්පු වුවහොත් ඕනෑම අවස්ථාවක එම පුද්ගලයා පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට කටයුතු කළ හැකිය.

## 11. අත්සන සහතික කිරීම :-

**අයදුම්කරුවන් සියළු දෙනාම තම අත්සන සහතික කරවා ගැනීම අත්‍යාවශ්‍ය වේ.** රජයේ ආයතනයක් මගින් අයදුම්කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ මහු වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධරයකු මගින් තම අත්සන සහතික කරවා ගත යුතුයි. අනෙක් අයදුම්කරුවන් තම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී සාම විනිසුරු, දිවුරුම් නිලධාරී, නීතිඥවරයකු, නොතාරිස්, නාවික හමුදා, යුද හමුදා, ගුවන් හමුදාවන්හි සේවයේ නියුතු නියෝගලත් නිලධාරියකු, රුපියල් 498,960.00 ට නොඅඩු වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර හෝ පළාත් පාලන හෝ පළාත් නිලධාරියෙකු, ආගමික නිකායන් භාරව කටයුතු කරන පූජක පක්ෂයේ පූජකයකු විසින් සහතික කළ යුතුයි.

## 12. විභාගය පරිපාටිය :-

මෙම විභාගයත් පහත සඳහත් පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වන අතර මෙය දෙමළ හා සිංහල භාෂා මාධ්‍යයෙන් පවත්වනු ලබයි. එමෙන්ම සුදුසුකම් සපුරා ඇති සිංහල මාධ්‍යය මඟින් වූ අයදුම්පත් යොමු වූ වනවිට සිංහල මාධ්‍යයෙන් ද විභාගය පැවැත්වීමට නියමිතය. අයදුම් කරන භාෂාව පසුව වෙනස් කිරීමට අවස්ථාව දෙනු නොලැබේ. විෂයමාලාව පහත සඳහන් පරිදි වේ.

| අංක | ප්‍රශ්න පත්‍රය | විෂය මාලාව | කාලය | සම්පූර්ණ ලකුණු |
|---|---|---|---|---|
| 01 | අභියෝග්‍යතා හා සාමාන්‍ය දැනුම | **අභියෝග්‍යතාව :-** අංක ගණිතය, තර්කානුකූල හැකියාව හා සාමාන්‍ය බුද්ධිය සම්බන්ධව අයදුම්කරුගේ දැනුම උරගා බැලීම සඳහා සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි. **සාමාන්‍ය දැනුම :-** මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රජාව, ආර්ථිකය, දේශපාලනය, සංස්කෘතිය හා තාක්ෂණය හා සබැඳි විෂයන් පිළිබඳ අභ්‍යන්තර හා විදේශීය ලෙස අයදුම්කරුගේ දැනුම උරගා බැලීම සඳහන් සකස් කරන ලද්දෙකි | පැය 01 | 100 |
| 02 | භාෂා ප්‍රවීණතාවය | කෙටියෙන් ලිවීම, අවබෝධ කර ගැනීම, වැරදි හඳුනා ගැනීම, පහසු ව්‍යාකරණ උපයෝගී කර ගැනීම ආදිය සම්බන්ධයෙන් අයදුම්කරුගේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වන ප්‍රශ්න පත්‍රයකි. | පැය 02 | 100 |

## 13. විභාග ප්‍රතිඵල :-

අපේක්ෂකයන්ගේ විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් www.np.gov.lk යන උතුරු පළාත් වෙබ් අඩවිය මඟින් නිකුත් කරනු ලැබේ. අනතුරුව විභාගයට පෙනී සිටි සෑම අපේක්ෂකයන්ටම තැපැල් මඟින් ප්‍රතිඵල යොමු කරනු ලැබේ.

14. මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් සියළුම බලතල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරයා සතුය. දෙමළ හා සිංහල මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන අවස්ථාවකදී දෙමළ මාධ්‍යයේ නිවේදනය අනුව කටයුතු කරනු ලැබේ.

15. මෙම තනතුරුවලට බඳවා ගැනීම සඳහා වූ ආදර්ශ අයදුම්පත්‍රය www.np.gov.lk යන උතුරු පළාත් සභාවේ වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය.

***එස්. තිරුවාකරන්***
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
01.02.2021